# 1.25 ආධාරක පංතිවල ගුරුවරුන්ගේ ඌනතාවලින් සිංහල භාෂාවට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

අනුරින් ඉන්දිකා දිවාකර
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

---

## ABSTRACT

මෙහි අරමුණ වන්නේ සිංහල භාෂාව භාවිත කරන විවිධ ක්ෂේත්‍රයන්හි භාෂාව පිරිහීමට හේතු වී ඇති මූලිකාංශයක් වන ආධාරක පංතිවල සිංහල භාෂාව උගන්වන ගුරුවරුන්ගේ ගැටලු පිළිබඳ ව විමසා බැලීමයි. මේ සඳහා පාදක කරගනු ලැබුවේ අ: පො: ස: උසස් පෙළ විභාගය සඳහා සිංහල විෂය උගන්වන ගුරුවරුන් හා සිංහල විෂය හදාරණ ශිෂ්‍යය ශිෂ්‍යයාවන්ය. ප්‍රධාන වශයෙන් සාකච්ඡාවලින් දත්ත සපයාගත් අතර ඒ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ආධාරක පංති සමහරක් තෝරා ගන්නා ලදී.

ආධාරක පංතිවලින් සිංහල භාෂාවට සිදුවන අහිතකර බලපෑම වර්ග කොට දැක්විය හැකිය. ඒ ගුරුවරුන්ගෙන් ඇතිවන බලපෑම හා ශිෂ්‍යයන්ගෙන් ඇතිවන බලපෑමය. මේ පර්යේෂණයේ දී ගුරුවරුන්ගෙන් සිංහල භාෂාවට ඇතිවන අහිතකර තත්ත්වය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන අතර එය **ඉගැන්වීමේ ක්‍රම** හා **ගුරුවරුන්ගේ ඌනතා** වශයෙන් වෙන්කොට දැක්විය හැකිය. මෙහි දී **ගුරුවරුන්ගේ ඌනතා** පිළිබඳ ව කරුණු විමර්ශනය කෙරේ. ඒ අනුව ඉගැන්වීම් පිළිබඳ නිසි පුහුණුවක් නොලැබූ අයවීම, පාසැල්වල උගන්වන ගුරුවරුන් නොවීම, හුදෙක් විශ්වවිද්‍යාලවලින් උපාධිය ලැබූ උපාධිධාරීන් වීම, සිත් ගන්නා සුළු ඉගැන්වීම් ක්‍රම සඳහා අනවශ්‍යය ඉගැන්වීම් ක්‍රම අනුගමනය කිරීම, තමන් පමණක් ඉගැන්වීමට සුදුසු බව, විෂය කරුණු දන්නා බව සිසුන් ඉදිරියේ සෑම විට ම තහවුරු කිරීමට උත්සහ දැරීම, පාඩම් මාලාවලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට උත්සහ නොගැනීම, ප්‍රශ්න, උත්තර කටපාඩම් කරවීම, විභාග මානසිකත්වයක් ගොඩනැගීම, පාසලේ උගන්වන විෂය කරුණු පිළිබඳ ව විශ්වාසය බිඳ හෙළීම ආදි කරුණු ප්‍රධාන වේ.

මෙයින් ඇතිවිය හැකි ප්‍රධාන ගැටලුව නම් අනාගතයේ දී සමාජයේ විවිධ තත්ත්වයන් නියෝජනය කරන මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට භාෂාව භාවිතයේ දී නිවැරදි ව භාෂාව පරිහරණය කිරීමට ප්‍රමාණවත් වූ දැනුමක් නොලැබීමයි. උදාහරණ වශයෙන් මුද්‍රිත මාධ්‍යය, විද්‍යුත් මාධ්‍යය, පර්යේෂණ කෘති, ශාස්ත්‍රීය කෘති, සාහිත්‍ය කෘති, පද රචනා, දේශන, රැස්වීම් හා සම්මන්ත්‍රණ ද, අධ්‍යාපන කාර්යයයේ යෙදෙන උසස් නිලධාරින් මෙන් ම ගුරුවරුන් ද සඳහන් කළ හැකිය. එසේ ම සමාජ වගකීම් දරන බොහෝ දෙනෙකුගේ ම චින්තනය, නිර්මාණ හැකියාව, රස වින්දනය පුළුල් පරාසයක් කරා විහිදී නොයන අතර සමාජ ප්‍රශ්නවලට මධ්‍යස්ථ ව මුහුණ දීමේ හැකියාව ද ඔවුන් සතු නොවෙනු ඇත.